# බළන්ගොඩ නගර සභාව

## 2016 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවට අයත් පොදු වෙළඳසැළ අංක 14 කඩ කාමරය බදුදීමට සුදුසු බදු කරුවෙක් තෝරා ගැනීම සඳහා ලංසු පත් කැඳවීම

2016 අප්‍රේල් මස පළමු වන දින සිට 2016 දෙසැම්බර් මස තිස් එක් වන දින දක්වා වූ කාලයක් සඳහා පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන අයිතමයන් වෙනුවෙන් මුද්‍රා තබන ලද ලංසුපත් බළන්ගොඩ නගර සභාවේ ලේකම් වන මා විසින් 2016 මාර්තු 30 වන දින පෙ.ව. 10.00 දක්වා භාරගනු ලැබේ.

**ලංසුපත් නිකුත් කිරිම:**

2016 මාර්තු 29 වන දින ප.ව. 3.00 දක්වා ලංසුපත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේදී නිකුත් කරනු ලැබේ. වැඩි විස්තර කාර්යාලිය දුරකථන අංක 045-2287275 ඇමතිමෙන් , urbanbg@sltnet.lk මගින් හෝ www.balangoda.uc.gov.lk ලබාගත හැකිය.

**ලංසුපත් භාර ගැනීම:**

2016 මාර්තු මස 30 වන දින පෙ.ව10.00 දක්වා ලංසු අයදුම්පත් භාරගනු ලැබේ.ඔබගේ ලංසු අයදුම් පත් නියමිත වෙලාවට පෙර නගර සභා කාර්යාලයේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලිය හැකි අතර එසේ නොමැති නම් නියමිත වේලාවට පෙර ලැබෙන සේ ලේකම්, බළන්ගොඩ නගර සභාව යන ලිපිනයට ලියාපදිංචිතැපෑලෙන් යොමු කල හැකිය.

**ලංසුපත් විවෘත කිරිම:**

2016 මාර්තු මස 30 වන දින පෙ.ව. 10.30 ට විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ලංසු අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයෙකුට හෝ සහභාගි විය හැකිය.

**උප ලේඛනය**

| අනු අංකය | කැඳවනු ලබන ලංසුවේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ලංසු ඇප තැන්පත් මුදල | ආපසු ගෙවනු නොලබන ලංසුපත් ගාස්තු | | | | අවම මාසික ලංසු මුදල |
|---|---|---|---|---|---|---|---|
| | | | ගාස්තුව | වැට් | ජා.ගො.බ | එකතුව | |
| 02 | බළන්ගොඩ පොදු වෙළඳසැල අංක 14 දරණ කඩ කාමරය | රු.3000.00 | රු.1000.00 | රු.112.00 | රු. 20.00 | රු.1132.00 | රු.6,750.00 |

- අවම ලංසුවට අමතරව රජය විසින් පනවා ඇති එකතු කල අගය මත බදු හා ජාතිය ගොඩ නැගිමේ බදු මුදල ද ගෙවිය යුතුය.
- තෝරා ගන්නා ලද බදුකරු විසින් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස තුනක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, ලංසුව පිරිනැම්මෙන් පසු පළමු පැය තුළ මසක කුලිය තැන්පත් කළ යුතුය. 2016.03.31 දින වන විට ඉතිරි මුදල්තැන්පත් කර සභාව සමඟ ගිවිසුම් අත්සන් කළ යුතුය.
- සියළුම හෝ ඕනෑම ලංසුපතක් පිළිගැනිම හෝ ප්‍රතික්ෂේප කිරිමේ අයිතිය බළන්ගොඩ නගර සභාව සතුය.

2016 මාර්තු මස 17 වන දින,
බළන්ගොඩ නගරසභාවේ දීය.

එම්.එච්.සීලවති,
ලේකම් හා බළන්ගොඩ නගර
සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී